# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1694/5 - 2011 පෙබරවාරි 23 වැනි බදාදා - 2011.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/80.

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2011 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මේ නියෝග ආහාර (ආනයනික ආහාරද්‍රව්‍යවල ආයුකාලය) නියෝග 2011 යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2011 අගෝස්තු මස 01 සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලුම ආහාර ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළට ගෙන එන අවස්ථාවේ දී, එම ආහාර ද්‍රව්‍ය අවම වශයෙන් සියයට හැටක් (60%) ඉකුත් නොවූ ආයු කාලයකින් සමන්විත විය යුතු ය ;

එසේ වුවද, ඉහත සඳහන් කරන ලද ආයු කාල පරිච්ඡේදය, ආනයනය කරනු ලබන අලුත් පලතුරු, එළවලු සහ ශුද්ධ කරනු නොලැබූ හා නොකැපූ අර්තාපල් සම්බන්ධයෙන් බලාත්මක නොවිය යුතු ය.

3. ආනයනය කරනු ලබන යම් ආහාර ද්‍රව්‍ය අයිතමයක, ආයුකාලය, එම නිෂ්පාදනයේ නිෂ්පාදකයා විසින් ප්‍රකාශ කරනු ලබන සහ එහි අමුණා ඇති ලේබලයේ දක්වා ඇති එහි නිෂ්පාදිත දිනය සහ කල් ඉකුත් වීමේ දිනය මත පදනම්ව නිශ්චය කළ යුතු ය.

4. මේ නියෝගවල කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති යම් ආහාර ද්‍රව්‍යයක නිෂ්පාදකයා විසින් "කල් ඉකුත්වීමේ දිනය", "දිනට පෙර සුදුසුයි" හෝ "දිනට" හෝ "දිනට පෙර භාවිතා කරන්න" යන වචන භාවිතා කිරීම මගින් එම ආහාරවල "ආයුකාලය අවසන්වීම" හඳුනාගනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල කාර්යය සඳහා "ආයු කාලය" යන්නෙන් නිෂ්පාදනයේ පෝෂණීය වටිනාකම, රසය, ස්වභාවය සහ පෙනුම ප්‍රකාරව මනුෂ්‍ය පරිභෝජනය සඳහා ආරක්ෂා සහිත වන්නාවූ ද, සතුටුදායක තත්ත්වයේ පවතින්නාවූද, නිෂ්පාදිත දිනය සහ පාරිභෝගිකයා විසින් පරිභෝජනය කරනු ලබන කාලය අතරතුර කාල පරිච්ඡේදය අදහස්වේ.

03 - 246